සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

# පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019

# First Term Test - Grade 11 - 2019

**නම : ..............................................** **ඉතිහාසය - I** **කාලය : පැය 01 යි.**

සැලකිය යුතුයි.

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 80ක් හිමිවේ.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (5) ලකුණ යොදන්න.

(iv) ප්‍රශ්න පත්‍රයෙහි දී ඇති අනෙකුත් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

---

1. සීගිරි කැටපත් පවුර වැදගත් වන්නේ කුමන හේතුවක් නිසා ද?
(1) එහි ඇඳ ඇති සිතුවම් නිසාවෙනි. (2) ගුප්ත කලා ආභාෂය ඇති නිසාවෙනි.
(3) එහි රචනා කර ඇති කුරුටු ගී නිසාවෙනි. (4) ජල තාක්ෂණය නිසාවෙනි.

2. පුරා විද්‍යාත්මක මූලාශ්‍රය අතර පැරණිතම සෙල්ලිපි වර්ගය වන්නේ
(1) ලෙන් ලිපිය (2) ගිරි ලිපිය (3) ටැම් ලිපිය (4) ආසන ලිපිය

3. පහත සඳහන් ප්‍රකාශ අතරින් විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ මින් කුමක් ද?
(1) සීලප්පදිකාරම් කෘතිය තුළින් ඈත අතීතයේ පටන් ශ්‍රී ලංකාව චීනය සමඟ වෙළෙඳ ගනුදෙනු කළ බවට තොරතුරු හෙළිවේ.
(2) ප්ලිනිගේ නැචුරාලිස් හිස්ටෝරියා කෘතිය ඉතා වැදගත් ග්‍රීක මූලාශ්‍රයකි.
(3) ෆර්නා ඕ ඩී ක්වේරොස් ලංකාවට පැමිණ ලංකාවේ තොරතුරු ඇසින් දැකබලා තොරතුරු වාර්තා කළ කතුවරයෙකි.
(4) ෆිලිප්පස් බැල්ඩියස්ගේ ලංකා පුරාවෘත්තය නම් කෘතිය ඉතා වැදගත් ඕලන්ද මූලාශ්‍රයකි.

4. අනුරාධපුර නගරය ''නුරුපුර'' ලෙස හඳුන්වා ඇති ප්‍රසිද්ධ අභිලේඛනය කුමක් ද?
(1) වල්ලිපුරම් සන්නස (2) පනාකඩුව සන්නස (3) ගල්පොත ලිපිය (4) අනුරාධපුර අභයගිරි ලිපිය

5. ගොඩබිම බෙල්ලන් වැඩිවශයෙන් තම ආහාර සඳහා එක්කරගනු ලැබුවේ කුමන පරිසර කලාපයක විසූ ගල් යුගයේ මානවයින් විසින් ද?
(1) පහතරට ශුෂ්ක කලාපය (2) පහතරට තෙත් කලාපය
(3) පහතරට වියළි කලාපය (4) තෙත් උස් කඳුකර කලාපය

6. පහත I තීරුවේ දැක්වෙන තොරතුරු II තීරුවේ දැක්වෙන තොරතුරු හා කිසියම් සබඳතාවයක් දක්වයි. I තීරුවේ අනුපිළිවෙළ අනුව II තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. තෙත් කලාපීය එළිමහන් වාසස්ථාන | A රාවණා ඇල්ල |
| 2. මිහිදන් කළ පුද්ගලයින් 12 දෙනෙකුගේ සැකිලි සොයාගත් ප්‍රාග් ඓතිහාසික ජනාවාසය | B කිතුල්ගල බෙලිලෙන |
| 3. දෙකට බෙදෙන සේ සිදුරු විදින ලද හිස්කබලක් හමුවීම | C ඉබ්බන්කටුව |
| 4. මුල් යකඩ යුගයට අයත් සොහොන් බිමකි. | D බෙල්ලන් බැඳි පැලැස්ස |

(1) CAB D (2) BDAC (3) DBCA (4) DBAC

7. පීඩන ශල්කනය නම් තාක්‍ෂණික මූලධර්මය යොදා ගනු ලැබුවේ කුමන කාර්යයක් ඉටුකරගැනීම සඳහා ද?
(1) වැව් බැම්ම ඉදිකිරීම සඳහා (2) ශිලා මෙවලම් තනාගැනීම සඳහා
(3) යකඩ මෙවලම් තනාගැනීම සඳහා (4) මැටිබඳුන් නිපදවීම සඳහා

8. පූර්ව රාජ සමයේ දී කුඩා ගම් වැව් පද්ධතියේ නායකයා වශයෙන් කටයුතු කළ පුද්ගලයා කවුරුන් ද?
(1) ගෘහපති (2) ගමික (3) පරුමක (4) රජ

9. ශ්‍රී ලංකාවේ දෙවන නාගරීකරණය අවධියේ බිහි වූ පළමු අගනගරය කුමක් ද?
(1) අනුරාධපුරය (2) පොළොන්නරුව (3) දඹදෙණිය (4) යාපහුව

10. ක්‍රිස්තු පූර්ව 2400 දී පමණ කාලයේ දී ලංකාවේ විසූ මානවයා යකඩ නිස්සාරණය කිරීමේ තාක්ෂණය දැන සිටි බවට සාධක හමුවන ස්ථානය කුමක් ද?
(1) බෙරගල (2) සමනල වැව (3) දඹුල්ල (4) ගල්සොහොන් කනත්ත

11. ඓතිහාසික මූලාශ්‍රවලට අනුව ලංකාව පරිපාලන දිස්ත්‍රික්කවලට බෙදා විධිමත් පාලනයක් ගෙනගිය ආරම්භක පාලකයා කවුරුන් ද?
(1) දුටුගැමුණු රජතුමා (2) වසභ රජතුමා (3) භාතිකාභය රජතුමා (4) කාශ්‍යප රජතුමා

12. අතීත ශ්‍රී ලංකාවේ කන්න තුනක් වගා කළ බවට සාධක හමුවන සෙල්ලිපිය කුමක් ද?
(1) මිහින්තලා පුවරු ලිපිය (2) බදුළු ටැම් ලිපිය
(3) රජගල ලිපිය (4) තෝනිගල ලිපිය

13. පැරණි සමාජයෙහි ව්‍යවස්ථාදායක හා විධායක කටයුතු මෙහෙයවන ලද ආයතනය කුමක් ද?
(1) සභාව (2) එක්තැන්සමිය (3) වදාළ (4) නියමස්ථානය

14. මෙම මුද්‍රාව හමුවූ ස්ථානය කුමක් ද?
(1) අනුරාධපුරය
(2) පොළොන්නරුව
(3) දඹදෙණිය
(4) තිස්සමහාරාමය



15. පහත A, B හා C සිදුවීම් අතරින් ගම්පොළ යුගයේ සිදු වූ සිදුවීම් පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?
A ජාවක චන්ද්‍රභානුගේ ආක්‍රමණය
B චෙං හෝ සෙනෙවියාගේ ආක්‍රමණය
C කෝට්ටේ කොටුව ඉදිකිරීම
D සපුමල් කුමරු යාපනය ජයගැනීම
(1) B හා C (2) A හා B (3) C හා D (4) A හා D

16. මහාවංස ටීකාවේ සඳහන් තොරතුරුවලට අනුව බ්‍රාහ්මණයින් ගේ ආගමික කටයුතු සඳහා ඉදිකරන ලද ගොඩනැගිලි විශේෂය කුමක් ද?
(1) සිවිකාසාලා (2) සොත්ථිසාලා (3) පණ්ණසාලා (4) වෙජ්ජසාලා

17. කාලය මැනීමේ ක්‍රමයක් ලෙස භාවිත කරන මාස ක්‍රමයට පදනම් වී ඇත්තේ
(1) පෘථිවියේ පිහිටීම (2) චන්ද්‍රයාගේ පිහිටීම (3) සූර්යාගේ ගමන (4) චන්ද්‍රයාගේ ගමන

18. අතීත ශ්‍රී ලංකාවේ ඇල මාර්ග ඉදිකිරීම සම්බන්ධයෙන් කටයුතු කළ නිලධාරියෙකු වන්නේ
(1) වපිහමික ය. (2) අධික ය. (3) නගරවුඩික ය. (4) ගමික ය.

19. ශ්‍රී මහා බෝධීන් වහන්සේ ලංකාවට වැඩම කරවන ලද්දේ
(1) මාතොට වරායෙනි. (2) ගෝකණ්ණතිත්ථයෙනි.
(3) ජම්බුකෝල පටුනෙනි. (4) ලංකා පටුනෙනි.

20. පහත A සිට F දක්වා දී ඇති පාලකයින් අතරින්, දකුණු ඉන්දීය කුලී හේවායින්ගේ සහාය පැතූ පාලකයින් පමණක් දැක්වෙන වරණය කුමක් ද?

A ඉළනාග රජු B පරාක්‍රමබාහු රජු
C අභයනාග රජු D දුටුගැමුණු රජු
E කාශ්‍යප රජු F I මුගලන් රජු

(1) FE හා B (2) A, C හා F (3) A, D හා F (4) C, E හා D

21. ඓතිහාසික සිදුවීම් කිහිපයක් පහතින් දැක්වේ.

A ශ්‍රී ලංකාව තුළ පළමුවරට මධ්‍යගත පාලනයක් ගොඩනැගීම
B මහමෙව්නා උයන සඟ සතු කොට පූජා කිරීම.
C ගඩලාදෙණිය විහාරය කරවීම.
D පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය කිරීම

ඉහත ඓතිහාසික සිදුවීම් ඒවා සිදු වූ අනුපිළිවෙළ අනුව පෙළ ගැස් වූ විට ලැබෙන නිවැරදි පිළිතුර කුමක් ද?

(1) A, B, C හා D ය. (2) D, A, C හා B ය. (3) B, A, D හා C ය. (4) B, D, A හා C ය.

22. අපේ පැරැන්නන් විසින් අවකාශය මැනීම සඳහා භාවිතා කළ මිනුම් ඒකකයක් වන්නේ

(1) කිරිය ය. (2) උක්ඛ ය. (3) මාසක ය. (4) වස ය.

23. රජු රටවැසියාට ඊශ්වරයෙකු විය යුතු බව සඳහන් කොට ඇති සෙල්ලිපියක් පිහිටා ඇති ස්ථානය කුමක් ද?

(1) මිහින්තලේ (2) අභයගිරිය (3) කළුදිය පොකුණ (4) දඹුල්ල

24. පළමුවන ගජබාහු රජු විසින් පිහිටුවා ඇති සෙල්ලිපියේ ''වටිති'' යනුවෙන් හඳුන්වා ඇත්තේ මොනවාද?

(1) වැව්වල ජලය භාවිත කරන්නන්ගෙන් අය කළ බද්ද
(2) විනිශ්චය ශාලාවෙන් ලැබෙන දඩමුදල්
(3) ඇළ මාර්ගවල මසුන් ඇල්ලීම වෙනුවෙන් අය කළ බද්ද
(4) වෙළෙඳ වරායෙන් අය කළ බද්ද

25. කිසිදු සතෙකු නොමැරිය යුතු බව සඳහන් කරමින් පළමුවරට මාඝාත නීතිය පැන වූ රජතුමා කවුරුන් ද?

(1) නිශ්ශංකමල්ල රජතුමා (2) හතරවන මිහිඳු රජු
(3) තුන්වන උදය රජතුමා (4) අමණ්ඩ ගාමිණී අභය රජතුමා

26. පැරණි පොත් පත් වල කරපිංචා හඳුන්වා ඇත්තේ

(1) කරඳමුංගු ලෙසය (2) කටුක භාණ්ඩ නමිනි (3) ඇඹුල් හඹු ලෙසය (4) කරඹෑඹිය ලෙසය

27. ඉන්දියානු සාගරය හරහා ක්‍රියාත්මක වූ අන්තර් ජාතික වෙළඳාම් කටයුතුවල බලය ක්‍රිස්තු වර්ෂ හයවන සියවසින් පසු අත්පත් කරගනු ලැබුවේ කවර ජාතිකයන් විසින් ද?

(1) අරාබි ජාතිකයන් (2) පෘතුගීසි ජාතිකයන් (3) ඕලන්ද ජාතිකයන් (4) ඉංග්‍රීසි ජාතිකයන් විසින්

පහත A සිට F දක්වා ඇති ඓතිහාසික සිදුවීම් ඇසුරෙන් 28 සිට 30 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A කාලිංග මාඝගේ ආක්‍රමණය
B කව්සිළුමිණ රචනා කිරීම
C ඉබන්බතූතාගේ ලංකා ගමන
D චන්ද්‍රභානුගේ ආක්‍රමණය
E දුර්වල පාලකයින් බලයට පත්වීම
F ත්‍රිභාෂා ශිලාලේඛනය පිහිට වීම

28. පොළොන්නරු රාජධානිය බිඳ වැටීමට බලපෑ හේතු දෙකක් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) D හා E (2) A හා C (3) A හා E (4) C හා B

29. දෙවන පැරකුම් රජුගේ පාලන සමය සම්බන්ධයෙන් වැදගත් සිදුවීම් ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) B හා D (2) A හා B (3) C හා F (4) F හා D

30. ගම්පොළ රාජධානි සමයේ දී සිදු වූ වැදගත් සිදුවීම් දෙකක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) A හා F (2) C හා E (3) B හා C (4) C හා F

31. පුනරුද සමයේ යුරෝපයේ සිටි දක්ෂ ගෘහ නිර්මාණ ශිල්පියෙකු වන්නේ
(1) නිකලස් කොපර්නිකස් ය. (2) මයිකල් ආන්ජිලෝ ය.
(3) ලොරෙන්සෝ මෙඩිසි (4) ගැලිලියෝ ගැලිලි

32. යුරෝපයේ කාර්මික විප්ලවය ආරම්භයේ දී නිර්මාණය වූ නව නිපැයුම් කිහිපයක නිපැයුම් කරුවන් කිහිප දෙනෙක් I තීරුවේ ද ඔවුන්ගේ නිපැයුම් කිහිපයක් II තීරුවේ ද දැක්වේ. I තීරුව අනුව II තීරුව ගැලපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. සැමුවෙල් ක්‍රොම්ප්ටන් | A මෝටර් රථය |
| 2. ඩෙම්ලර් | B පේළියට වැපිරීමේ ක්‍රමය |
| 3. සැමුවෙල් මෝස් | C මියුල් යන්ත්‍රය |
| 4. ජේත් රෝටල් | D විදුලි පණිවිඩ ක්‍රමය |

(1) A C B D (2) A C D B (3) C A D B (4) B D A C

පහත A, B, C හා D වලින් දැක්වෙන ප්‍රකාශ පද යුගල අධ්‍යයනය කර 33 සිට 35 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. 1. 1797/98 බ්‍රිතාන්‍ය විරෝධී අරගලය
2. පොල්ගස් බද්ද

B. 1. 1818 උඩරට කැරැල්ල
2. මොනරවිල කැප්පෙටිපොල

C. 1. ඉඩම් කොටුකිරීමේ ව්‍යාපාරය
2. කෘෂිකර්මාන්තය

D 1. ධනවාදය
2. නිර්බාධ වාදය

33. පළමුවැන්න ඇතිවීම කෙරෙහි දෙවැන්න හේතු වන බව දැක්වෙන ප්‍රකාශ/පද යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

34. දෙවැන්නේ සංවර්ධනයට පළමුවැන්න හේතු වූ බව දක්වන ප්‍රකාශ/පද යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

35. පළමුවැන්නේ වර්ධනය කෙරෙහි දෙවැන්න හේතු වූ බව දක්වන ප්‍රකාශ/පද යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D

36. මදුරාසි පාලනය යටතේ ශ්‍රී ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ පාලනයට පත් කරන ලද ඉහළ නිලධාරියා කවුරුන් ද?
(1) කලෙක්ටර් (2) අවුමිල්දාර් (3) කපිතාන් (4) රෙසිඩන්ට්

පහත දැක්වෙන A හා B යටතේ ඇති තොරතුරු ඇසුරෙන් 37 හා 38 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - පිළිමතලාවේ
B - මොල්ලිගොඩ

37. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු බලයට පත්කිරීම සම්බන්ධයෙන්
(1) A හා B සත්‍ය වේ. (2) A හා B අසත්‍ය වේ.
(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

38. 1818 කැරැල්ලේ දී ඉංග්‍රීසීන්ට සහායදීම සම්බන්ධයෙන්
(1) A හා B සත්‍ය වේ. (2) A හා B අසත්‍ය වේ.
(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

39. ඉංග්‍රීසීන් විසින් පනවන ලද ''පාරබද්ද' නම් බද්ද සඳහා අයකළ මුදල් ප්‍රමාණය වන්නේ
(1) සිලිං දෙකකි (2) සිලිං තුනකි (3) සිලිං හතරකි (4) සිලිං පහකි.

40. 1848 කැරැල්ලෙන් අනතුරුව ආපසු බ්‍රිතාන්‍යයට කැඳ වූ ආණ්ඩුකාරවරයා කවුරුන් ද?
(1) ෆෙඩ්රික් නෝර්ත් (2) තෝමස් මෙට්ලන්ඩ් (3) රොබට් බ්‍රවුන්රිග් (4) ටොරිංටන් සාමි

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019
## First Term Test - Grade 11 - 2019

නම : ............................................... ඉතිහාසය - II කාලය : පැය 03 යි.

සැලකිය යුතුයි.

- I කොටසේ පළමුවැනි ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

### I කොටස

01. (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) ත්‍රිකුණාමලය, පරාක්‍රම සමුද්‍රය, නිල්වලා ගඟ, ඉරණමඩු වැව, හලාවත, ගම්පොළ, මඩකලපුව, මාහියංගල, කල්පිටිය, කලා ඔය, රයිගම (ලකුණු 12)

(ii) රෝමය, ජිනෝවා, පර්සියන් බොක්ක, ජාවා දූපත, කැලිකට්, බ්‍රිතාන්‍ය (ලකුණු 06)

(ආ) (i) පහත A, B C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින් කවුරුන්දැයි අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

A 1766 වර්ෂයේ දී ලන්දේසින් සමඟ ගිවිසුමක් අත්සන් කළ උඩරට පාලකයා

B ගන්නෝරුව සටන මෙහෙය වූ ඉංග්‍රීසි කපිතාන් ජනරාල්වරයා

C කාර්මික විප්ලවය අවධියේ දී බැටලු අභිජනන ක්‍රමය හඳුන්වා දීම

D 1804 වර්ෂයේ දී කෝපි කෙටීමේ මෝලක් ඇරඹි ආණ්ඩුකාරවරයා

A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න. (ලකුණු 04)

(ii) 1. 'A' වලින් දැක්වෙන රූපය හඳුනාගෙන නම් කරන්න.

2. මෙම දාගැබ ඉදිකරන ලද්දේ කවුරුන් විසින් ද?

3. ඉදිකරන ලද මුල්ම අවධියේ දී මෙම දාගැබ කුමන හැඩයකින් යුක්ත වී ද?

4. දාගැබ වටා පිහිටා ඇති ගල් කණු උපයෝගී කරගනිමින් ඉදිකර තිබූ ඉදිකිරීම කුමක් ද?

(ලකුණු 04)

A



B



(iii) 1. 'B' වලින් දැක්වෙන පාලකයා හඳුනාගෙන නම් කරන්න.

2. ඔහු කුමන රාජ වංශයකට අයත් වූයෙක් ද?

3. මෙතුමා දළදා මාළිගයට එක්කල සුවිශේෂ වාස්තු විද්‍යා නිර්මාණය කුමක් ද?

4. මොහු කුමන පාලකයකුගේ අනුප්‍රාප්තිකයෙකු ද?

(ලකුණු 04)

## II කොටස

02. (i) A ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් කාල පරිච්ඡේද ඇසුරින් දීර්ඝ කාලයක් පැවති යුගය කුමක් ද? (ලකුණු 01)

B ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය සම්බන්ධයෙන් සාධක හමුවන,

1. රත්නපුරය අවට ප්‍රදේශයේ පිහිටි බොරළු මිශ්‍ර පස් තට්ටුව හඳුන්වන නම (ලකුණු 02)
2. අර්ධ ශුෂ්ක කලාපයේ පිහිටි මැටි සහිත වැලි පසකින් වැසුනු බොරළු තට්ටුව හඳුන්වන නම

(ii) පූර්ව ඓතිහාසික යුගය ප්‍රාග් ඓතිහාසික ගල් යුගයෙන් වෙන්කොට හඳුනාගත හැකි ලක්ෂණ 04ක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ප්‍රාග් ඓතිහාසික මානවයා සිය ජනාවාස තෝරාගැනීමේ දී අවධානය යොමු කළ කරුණු දෙකක් නම් කර ඒ ඇසුරින් ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ජනාවාස පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ප්‍රාග් ඓතිහාසික මානවයා අවමංගල කටයුතු වලදී අනුගමනය කළ ක්‍රියාමාර්ග තුනක් ඇසුරෙන් ප්‍රාග් ඓතිහාසික යුගයේ අවමංගල අභිචාර විධි පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 06)

03. (i) පූර්ව රාජ සමයේ දී පාලන කටයුතු හා සම්බන්ධ වූ නිලධාරීන් තිදෙනකු නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු වරහන තුළින් තෝරා ලියන්න.

1. වියළි කලාපයේ වැසියන් ගම් වැව් පද්ධතියක් හඳුන්වා ඇති නම
2. ශ්‍රී ලංකාව තුළ පළමු වරට මධ්‍යගත පාලනයක් ගොඩනැගීම
3. කුරුණෑගල වැව කරවීම
4. ''අලකපය'' මහ රජ ලෙස හැඳින්වීම (ලකුණු 04)

(I කාශ්‍යප රජු, වැව් ප්‍රපතනය, එල්ලංගාව, පණ්ඩුකාභය, දුටුගැමුණු, බුවනෛකබාහු රජු)

(iii) ශ්‍රී ලංකාවේ රාජ්‍යත්වය උරුම වූ සම්ප්‍රදායන් දෙකක් නම් කර උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) වසභ රජුගේ කාර්යභාරය උදාහරණ 3ක් ඇසුරින් විස්තර කරන්න.

04. (i) රජරට ශිෂ්ටාචාරය බිඳවැටීමෙන් පසු රුහුණු, මායා, මලය ප්‍රදේශ කේන්ද්‍ර කරගනිමින් බිහිවූ ස්වාධීන පාලන මධ්‍යස්ථාන 03ක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පොළොන්නරු රාජධානිය බිඳ වැටීමට බලපෑ සාධක 04ක් නම් කරන්න. (ලකුණු 04)

(iii) දෙවන නාගරීකරණය අවධියේ දී ශ්‍රී ලංකාවේ ආර්ථික රටාවේ සිදු වූ වෙනස්කම් කරුණු දෙකක් යටතේ විස්තර කරන්න. (ලකුණු 05)

(iv) දෙවන පරාක්‍රමබාහු රජුගේ පාලන සමයේ වැදගත්කම උදාහරණ තුනක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

05. (i) A මහනුවර රාජධානිය හැඳින්වූ නම් දෙකක් ලියන්න.

B මහනුවර නගරය කේන්ද්‍ර කරගනිමින් පළමුවරට ස්වාධීන පාලන මධ්‍යස්ථානයක් ගොඩනගනු ලැබුවේ කවුරුන් ද? (ලකුණු 03)

(ii) මහනුවර රාජධානි සමයේ ක්‍රියාත්මක වූ බද්දෙ සංවිධානයේ පහත අංශයන්හි කාර්යභාරයන් වරහන තුළින් තෝරා අනුපිළිවෙළින් ලියා දක්වන්න.

මඩිගෙ බද්ද,

කුරුවෙ බද්ද,

බඩහැල බද්ද,

රදා බද්ද

(රෙදි විවීම, ඇතුන් ඇල්ලීම, ප්‍රවාහන කටයුතු, රෙදි සේදීම, වළං තැනීම) (ලකුණු 04)

(iii) පළමුවන විමලධර්මසූරිය රජු රාජ්‍යත්වයට පත්වීමේ දී මුහුණදුන් අභියෝග දෙකක් නම්කර ඔහු තමාට එල්ල වූ අභියෝග ජයගත් අන්දම විස්තර කරන්න. (ලකුණු 05)

(iv) මහනුවර යුගයේ ප්‍රාදේශීය පාලනය ක්‍රියාත්මක වූ අයුරු විස්තර කරන්න. (ලකුණු 06)

06. (i) A ප්‍රාග් ඓතිහාසික ගල් යුගයේ මානවයා භාවිත කළ මෙවලම් හඳුන්වන නම කුමක් ද?

B ඔවුන් එම මෙවලම් තනාගැනීම සඳහා බහුලව භාවිත කළ පාෂාණ වර්ගය කුමක්ද?

C එම මෙවලම් තනාගැනීම සඳහා භාවිතකළ තාක්ෂණික ක්‍රමය හඳුන්වන නම කුමක් ද? (ලකුණු 03)

(ii) වැවක දැකිය හැකි පහත සඳහන් තාක්ෂණික ඉදිකිරීම්වල ඇති ප්‍රයෝජනය බැගින් ලියන්න.

A දියකැට පහන

B මඩසොරොව්ව

C රළපනාව

D ඇතුළුවාන (ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාවේ පැරණි යකඩ නිස්සාරණය කිරීමේ තාක්ෂණය කෙබඳුදැයි වටහා ගැනීමට ප්‍රමාණවත් සාධක හමුවන ස්ථාන දෙකක් නම් කර එම එක් ස්ථානයක යකඩ නිස්සාරණය කිරීමේ ප්‍රමවේදය කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

(iv) රුවන්වැලි සෑයේ අත්තිවාරම ඉදිකිරීමේ දී අනුගමනය කළ තාක්ෂණික ක්‍රමවේදය සැකෙවින් විස්තර කරන්න.

(ලකුණු 06)

07. (i) බ්‍රිතාන්‍ය ජාතිකයින් ශ්‍රී ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශය පාලනය කළ පාලන ක්‍රම තුන නම් කරන්න.

(ලකුණු 03)

(ii) 1815 උඩරට ගිවිසුමේ වගන්ති 02ක් නම් කරන්න. (ලකුණු 04)

(iii) 1818 උඩරට නිදහස් සටන් ව්‍යාපාරය කෙරෙහි බලපෑ හේතු දෙකක් දක්වා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) 1848 සටන ඇතිවීමට හේතු වූ කෝල්බෲක් ප්‍රතිසංස්කරණ 03ක් දක්වා කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 06)

## III කොටස

08. (i) යුරෝපයේ පුනරුදය ඇතිවීමට බලපෑ හේතු 03ක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පුනරුද සමයේ කලා ශිල්ප ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස් කම් 04ක් නම් කරන්න. (ලකුණු 04)

(iii) A පුනරුදය අවධියේ දී පල්ලියේ ආධිපත්‍ය විවේචනය කළ පුද්ගලයින් දෙදෙනෙකු නම් කරන්න.

B මධ්‍යතන යුගයේ ගෘහනිර්මාණ ශිල්පීය ලක්ෂණවලට වඩා පුනරුද සමයේ ගෘහ නිර්මාණවල දැකිය හැකි වෙනස්කම් 03ක් නම් කරන්න. (ලකුණු 05)

(iv) පුළුල් වෙනසකට ලක් වූ ක්ෂේත්‍ර 03ක් ඇසුරෙන් පුනරුදය ලංකාව කෙරෙහි බලපෑ ආකාරය විස්තර කරන්න. (ලකුණු 06)

09. (i) කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යයෙන් ආරම්භවීමට බලපෑ හේතු 03ක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත සඳහන් සොයාගැනීම් සිදු කළ පුද්ගලයින් කවුරුන්දැයි පිළිවෙළින් නම් කරන්න.

A දුවන නඩාව නිර්මාණය කිරීම

B ආරක්ෂක ලාම්පුව නිපදවීම

C දුම්රිය එන්ජිම

D කේබල් මගින් කටහඬ හුවමාරු කිරීමේ ක්‍රමය හඳුන්වා දීම (ලකුණු 04)

(iii) A කාර්මික විප්ලවය වෙනත් රටවල් කරා ව්‍යාප්ත වීමට බලපෑ හේතු 03ක් නම් කරන්න.

B කාර්මික විප්ලවයේ බලපෑම නිසා යුරෝපයේ ප්‍රචලිත වූ නව දේශපාලන දර්ශන 02ක් නම් කරන්න. (ලකුණු 05)

(iv) කාර්මික විප්ලවයේ අහිතකර බලපෑම් 03ක් විස්තර කරන්න. (ලකුණු 06)

1. (අ) (i)

1. (அ) (i)

1. (a) (i)



1. (අ) (ii)

1. (அ) (ii)

1. (a) (ii)



සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2019
## First Term Test - Grade 11 - 2019

නම : ............................................... ඉතිහාසය පිළිතුරු පත්‍රය කාලය : පැය 01 යි.

I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | (3) | 11. | (2) | 21. | (3) | 31. | (2) |
| 2. | (1) | 12. | (4) | 22. | (1) | 32. | (3) |
| 3. | (4) | 13. | (2) | 23. | (4) | 33. | (1) |
| 4. | (2) | 14. | (4) | 24. | (2) | 34. | (3) |
| 5. | (2) | 15. | (1) | 25. | (4) | 35. | (2) |
| 6. | (4) | 16. | (2) | 26. | (4) | 36. | (4) |
| 7. | (2) | 17. | (4) | 27. | (1) | 37. | (3) |
| 8. | (3) | 18. | (2) | 28. | (3) | 38. | (4) |
| 9. | (3) | 19. | (3) | 29. | (1) | 39. | (2) |
| 10. | (1) | 20. | (2) | 30. | (4) | 40. | (4) |

I කොටස

01. (අ) (i)




(ii)



(ආ) (i) A කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා
B දියෝගෝ ද මෙලෝ
C රොබට් බැක්වෙල්
D ෆෙඩ්රික් නෝර්ත්
(ii) 1. ථූපාරාම දාගැබ
2. දේවානම්පියතිස්ස රජතුමා
3. ධාන්‍යාකාර හැඩය
4. ථූප සරය, චෛතිය සරය, වටදාගෙය
(iii) 1. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු
2. නායක්කර් රාජ වංශය
3. පත්තිරිප්පුව
4. රාජාධිරාජසිංහ රජු

II කොටස

02. (i) A ගල් යුගය
B (i) ඉල්ලම්
(ii) ඉරණමඩු සැලැස්ම
(ii) යකඩ මෙවලම් භාවිතය
පිළිස්සූ මැටි වළං භාවිතය
කෘෂිකර්මයට අවතීර්ණ වීම
ස්ථිරවාසීතාව
ක්‍රමවත් සුසාන ක්‍රම භාවිතය
(iii) - ආහාර සඳහා අවශ්‍ය සම්පත් බහුලව පැවතීම
- අවශ්‍ය පමණට ජල පහසුව ඇතිවීම
- ශිලා මෙවලම් තනාගැනීමට අවශ්‍ය පාෂාණ වර්ග පහසුවෙන් ලබාගත හැකිවීම
ගල්ගුහා හා එළිමහන් ස්ථාන ජනාවාස ලෙස තෝරාගත් බවත් ඊට හේතු හා උදාහරණ ඇසුරෙන් විස්තර කර තිබීම
(iv) - ගුහා තුළ වළ දැමීම කිතුල්ගල බෙලිලෙන
බෙල්ලන්බැඳි පැලැස්ස
- හිස්කබල් සිදුරු කිරීම රාවණා ඇල්ල ගුහාව
- හිස්කබලේ ඉදිරියට නෙරා එන කොටස් ගලක උලා ඔප මට්ටම් කිරීම
- ගුරුගල් ආලේපය
- වෙනත් තැනක වළ දැමූ දේහයේ සැකිල්ල නැවත ගොඩගෙන නවා වකුටු කර නැවත වළ දැමීම කුරුවිට බට දොඹලෙන

03. (i) ගෘහපති, ගමික, පරුමක
(ii) 1. එල්ලංගාව
2. දුටුගැමුණු රජතුමා
3. III බුවනෙකබාහු රජතුමා
4. I කාශ්‍යප රජතුමා
(iii) I පිය උරුමය සහෝදරයා ගෙන් සහෝදරයාට (දුටුගැමුණු, සද්ධාතිස්ස වැනි)
පියාගෙන් පුතාට (කාවන්තිස්ස දුටුගැමුණු වැනි Eg)
* II මව්උරුමය රජුගෙන් පසු රජුගේ සහෝදරියගේ පුතාට ගම්පොල යුගය පැරකුම් රජුට පසුව ඔහුගේ සහෝදරියගේ පුත් II වික්‍රමබාහු රජවීම
රජුගේ දියණියගේ පුතාට (මුණුබුරාට) රාජ්‍ය උරුම වීම
බුවනෙක බාහු රජුට පසුව ඔහුගේ දියණිය වූ සමුද්‍ර දේවියගේ පුත් ධර්මපාල කුමරු රජවීම.
* රජුගේ බිසවගේ සහෝදරයාට උරුමවීම නායක්කර් රාජ වංසය
(iv) ලම්භකර්ණ රාජ වංසයේ ආරම්භකයා වීම
මහවැව් ඉදිකිරීමේ පුරෝගාමියා වීම
ශ්‍රී ලංකාව.............. දිස්ත්‍රික්කවලට බෙදා පාලනය කිරීම.

04. (i) රුහුණේ ගෝවින්ද මලය (බුවනෙකබාහු ආදිපාද)
මිනිපේ ගංදෙනිය පර්වතය (සංඛසෙනෙවි)
යාපහුව (සුභ සෙනෙවි)
(ii) දුර්වල පාලකයින් බලයට පත්වීම
කාලිංග හා පාණ්ඩ්‍ය වංශිකයන් අතර බල අරගලය
ආර්ථික පරිහානිය
කාලිංග මාඝගේ ආක්‍රමණය
(iii) වාරිමාර්ග ඉදිකිරීමට අවධානය යොමු නොවීම
වැඩිවශයෙන් අහස් දියෙන් වගා කිරීම
වාණිජ ආර්ථික රටාවකට යොමුවීම
ආනයන අපනයන ආර්ථික රටාවකට හුරුවීම
(iv) අධ්‍යාපනය හා සාහිත්‍ය යන අංශයෙන් ප්‍රබෝධමත් යුගයක් වීම.
චන්‍ද්‍රභානුගේ ආක්‍රමණ 02 මර්ධනය කිරීම
කාලිංසමාඝ පරාජයට පත් කිරීම

05. (i) A කන්දේ නුවර, සෙංකඩගල, උඩරට රාජධානිය
B සේනා සම්මත වික්‍රමබාහු රජතුමා
(ii) A ප්‍රවාහන කටයුතු
B ඇතුන් ඇල්ලීම
C වළං තැනීම
D රෙදි සේදීම

| අභියෝග | අභියෝග ජයගත් අන්දම |
|---|---|
| (iii) නීත්‍යානුකූල රාජ්‍ය උරුමයක් නැතිවීම | කුසුමාසන දේවිය විවාහ කර ගැනීම දළදා වහන්සේගේ භාරකාරිත්වය ලබාගැනීම |
| පෘතුගීසින්ගෙන් එල්ල වූ තර්ජන | දන්තුරේ හා බලන සටනින් පෘතුගීසින් පරාජයට පත්කිරීම |
| සීතාවකින් එල්ල වූ බලපෑම | සටන්වලින් සීතාවක රජු පරාජයට පත් කිරීම |
| පරිහානියට පත් බුදු සසුන නඟාසිටුවීම | වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය<br>උපසම්පදාව පිහිටවීම දළදා මාලිගය ඉදිකිරීම |
| ආර්ථිකය පරිහානියට පත්වී තිබීම | කජු වගාව දියුණු කිරීම<br>යකඩ හා වානේ කර්මාන්තය නගා සිටුවීම<br>වෙඩි ලුණු කර්මාන්තය දියුණු කිරීම |

(iv) රටවසම නමින් හැඳින්විම. පරිපාලන ඒකක 21 කින් සමන්විත බව. ප්‍රාදේශීය පාලනය රට හා දිසාව වශයෙන් කොටස් 2කින් සමන්විත වීම. දිසාවන් 12කි. අගනගරයට ආසන්න ප්‍රදේශ රට නමින් හැඳින්වූ අතර රටවල් 9කි. ඉන් අනතුරුව රට හා දිසාව කෝරල වලට හා පත්තු වලට බෙදා තිබූ බව රට නමැති ඒකකය රටේ මහත්වරු විසින් ද දිසාව දිසාවේ වරයා විසින් ද පාලනය කර ඇත.

06. (i) A ශිලා මෙවලම් — රළු ශිලා මෙවලම් / ජ්‍යාමිතික ක්ෂුද්‍ර ශිලා මෙවලම්

B තිරිවානා හෙවත් බිම වීදුරු

C පීඩන ශල්කනය/වෙරපහර

(ii) A සොරොව්වෙන් පිටකරන ජල ප්‍රමාණය සීමා කිරීම

B වැවට එක්වෙන රොන්මඩ ඉවත් කිරීම

C වැවේ දිය තරංගවලින් වැව් බැම්ම සේදීයාම වැලැක්වීම.

D පිටත ජල ප්‍රභවයකින් ලැබෙන ජලය වැවට ඇතුල් කරගැනීම

(iii) 1. බලන්ගොඩ සමනළ වැව ප්‍රදේශය ස්වාභාවික සුළං බලයෙන්

2. සීගිරිය අලකොල වැව දෙහිගහ ඇලකන්ද ප්‍රදේශය කෘතිම සුළඟ මඟින්

3. සීගිරිය අලකොල වැව දෙහිගහ ඇලකන්ද ප්‍රදේශයේ කෘතිමව මයින හමක් මගින් උපදවාගත් සුළං බලය මගින් උඳුන් ක්‍රියාත්මක කර යකඩ නිස්සාරණය කිරීම

4. දහනය සඳහා දව යොදා ගැනීම (මරං ගසේ අඟුරු)

5. ලිමොනයිට්, හෙමටයිට් වැනි යකඩ මිශ්‍ර පස් (යපස්) යොදා ගැනීම

(ii) රියන් හතක් ගැඹුරට අත්තිවාරම කැපීම හුණුගල් යොදා තැලීම, වෙඩරු මැටි යෙදීම, ගල් තට්ටු යෙදීම, බොරලු තට්ටුවක් යෙදීම ඒ මත පළිගු ගල් තට්ටුවක් ඇතිරීම, නවනිත මැටි ආලේප කිරීම, දිවුල් මැලියම් තවරණ ලද යකඩ දැලක් යෙදීම අනතුරුව තලතෙල්වලින් තෙමන ලද රන්සිරියල් ගල් යෙදීම මගින් වර්තමාන කොන්ක්‍රිට් තාක්ෂණයට සමාන වන අයුරින් ඉදිකිරීම. සිදුකර ඇති අයුරු විස්තර කර තිබීම.

07. (i)
- මදුරාසි පාලනය (පෙරදිග ඉන්දියා ඉංග්‍රීසි වෙළෙඳ සමාගම් පාලනය)
- ද්විත්ව පාලනය
- කිරීටයේ පාලනයට නතු වීම

(ii)
- ශ්‍රී වික්‍රමරාජසිංහ රජුට හා ඔහුගේ ඥාතීන්ට උඩරට සිංහාසනයට ඇති අයිතිය අහෝසි කිරීම
- උඩරට රාජ්‍ය ඉංග්‍රීසින්ට අයත් වූ බව
- උඩරට නිලධාරීන්ගේ වරප්‍රසාද හා අයිතිවාසිකම් සුරකින බව
- බුද්ධ ශාසනය හා දේවාගම කඩ නොකොට පවත්වාගෙන යන බව
- උඩරට සාම්ප්‍රදායික නීතියට අනුව උඩරට ප්‍රදේශ පාලනය කරන බව

(iii)
- නිදහස අහිමි වීම හා රජෙකු නැතිවීම පිළිබඳ පසු තැවිල්ල
- ආගම හා සංස්කෘතික පිළිබඳ පැන නැගුන ගැටළු
- උඩරට රදළ වරුන්ගේ වරප්‍රසාද කඩවීම
- දොරේසාමි නම් රජෙකු පැන නැගීම
- ඉංග්‍රීසීන් විසින් උඩරට ගිවිසුම කඩ කිරීම වැනි හේතු ඇසුරෙන් විස්තර කර තිබීම

(iv)
- රජයේ ඉඩම් ප්‍රතිපත්තිය

උඩරට ඉඩම් වතු වගාවට ලබා ගැනීම

වගාවට ඉඩම් අහම් වීම

1840 මුඩුබිම් පනත

- ගම්සභාව අඩපණ වීම

ජනතාවගේ ගැටළු විසඳා ගැනීමට දුර බැහැර ඇති අධිකරණවල පිහිට පැතීමට සිදුවීම. ඒ සඳහා විශාල කාලයක් මුදලක් වැය වීම.

ı නව අධිකරණ ක්‍රමය

ı රජය හා මහජනතාව අතර සබඳතාවය දුරස් වීම

ලංකාව පළාත් පහකට බෙදීම

සිවිල් සේවක තනතුරු සංඛ්‍යාව අඩු කිරීම

III කොටස

08. (i) කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කිවරුන් යටතට පත්වීම.

වෙළෙඳාම දියුණුවීම හා නව ධනවතුන් පිරිසක් බිහිවීම

බුද්ධි ප්‍රබෝධය – පල්ලියේ ආධිපත්‍යය විවේචනය වීම / ශාස්ත්‍රීය ප්‍රබෝධය

(ii) කලාවට අනුග්‍රහ දක්වන ධනවතුන් පිරිසක් බිහිවීම

ස්වාධීනව කලා නිර්මාණ බිහිකිරීම

නිර්මාණ කරුවාගේ නමින් නිර්මාණ එළිදක්වීම

පෞද්ගලිකත්වය ඉස්මතු වන අයුරින් නිර්මාණ කිරීම

කලාව පල්ලියේ ආධිපත්‍යයෙන් මිදීම

(iii) A ජෝන් වයික්ලිප්, ජෝන් හස්, ඉරාස්මස්, මාටින් ලූතර්

B වටකුරු ආරුක්කු

උස්කුළුණු

අර්ධගෝලාකාර ශිඛර

(iv) 1. දේශපාලන වෙනස්කම්

රාජාණ්ඩු ක්‍රමය බිඳ වැටීම, පාර්ලිමේන්තු පාලන ක්‍රමය, නව නිලධාරි පන්තියක් බිහිවීම, යුක්තිය පසිඳලීමේ අධිකරණ පද්ධතියක් හඳුන්වා දීම

2. ආර්ථික වෙනස්කම්

යුරෝපය සමඟ සෘජු වෙළෙඳ සබඳතා ඇතිවීම

ව්‍යාපාරික වතුවගාව හඳුන්වා දීම

ග්‍රාමීය ස්වයං පෝෂිත ආර්ථික බිඳවැටීම

මුදල් භාවිතය ප්‍රචලිත වීම

වෙළෙඳනගර බිහිවීම

3. සමාජ සංස්කෘතික වෙනස්කම්

මුද්‍රණ කර්මාන්තයේ දියුණුව නිසා දැනුවත් සමාජයක් බිහිවීම

ලංකාවේ පිරිස් යුරෝපයට ගොස් අධ්‍යාපනය ලැබීම නිසා බටහිර චින්තනයේ අභාෂය ලංකාවට ලැබීම

රෝමානු කතෝලික හා රෙපරමාදු ආගම ප්‍රචලිත වීම

බටහිර අධ්‍යාපන ක්‍රමය දායාදවීම

බටහිර ඇඳුම් පැළඳුම් ආහරණ ගෘහ නිර්මාණ ලංකාවට දායාද වීම

09. (i) 1. යුරෝපයේ අනිකුත් රටවලට වඩා වෙළෙඳ හා වාණිජ දියුණුවක් අත්පත් කර ගැනීම

2. කර්මාන්ත සඳහා මුදල් ආයෝජනය කළ හැකි ධනවතුන් පිරිසක් බිහිවීම

3. යුරෝපයේ පුනරුදය නිසා බ්‍රිතාන්‍යයේ විද්‍යාත්මක ක්ෂෙත්‍රයේ දියුණුවක් ඇතිවීම.

4. යන්ත්‍ර සූත්‍ර නිපදවීමට අවශ්‍ය යකඩ හා වානේ බහුලව පැවතීම

5. ගල් අඟුරු වැනි කාර්ක්ෂම බලශක්තීන් බ්‍රිතාන්‍යයේ බහුලව පැවතීම

6. ජනගහනය වැඩිවීමත් යටත් විජිත වලිනුත් භාණ්ඩ හා සේවා වලට ඉල්ලුමක් ඇතිවීම

7. බ්‍රිතාන්‍යයේ දේශපාලන ස්ථාවරත්වය

8. ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාර

(ii) A ජෝන් කේ

B හම්ප්‍රිඩේවි

C ජෝර්ජ් ස්ටීවන්සන්

D ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල්

(iii) A 1. ලොව පුරා ජනගහනය සීඝ්‍රයෙන් වර්ධනය වීම නිසා භාණ්ඩවලට තිබූ ඉල්ලුම ඉහළ යාම

2. යුරෝපය තුළ ගමනාගමන හා ප්‍රවාහන කටයුතුවල වර්ධනය

3. ප්‍රංශය හා ජර්මනිය ගල් අඟුරු සොයා ගැනීම

4. මාර්ග පද්ධතියේ දියුණුව

5. සන්නිවේදන ක්ෂේත්‍රයේ දියුණුව

B ලිබරල්වාදය, සමාජවාදය

(iv) ජනගහනය වර්ධනය නිසා නාගරීකරණය ඇති වී නාගරීකරණ ගැටළු ඇතිවීම

ළමුන්ට හා කාන්තාවන්ට අනාරක්ෂිතව සේවය කිරීමට සිදුවීම

මුඩුක්කු පරිසර ගොඩනැගීම

දුප්පත්කම, පහත් ජීවන මට්ටමේ පිරිස් බිහිවීම

පරිසර දූෂණය